# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2235/22 - 2021 ජූලි මස 06 වැනි අඟහරුවාදා - 2021.07.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළකරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග), මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (8) වන අනුඡේදයෙහි (උ) අයිතමය මෙමගින් අවලංගු කරනු ලබන අතර පහත අයිතමය සමග ආදේශ කරනු ලැබේ.

(උ) "කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ශ්‍රී ලංකා රුපියල්වලින් වන ණය සුරකුම් පත්වල"

(2) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (8) වන අනුඡේදයෙහි (ඌ) අයිතමය ලෙස පහත අයිතමය ඇතුළත් කරනු ලැබේ.

(ඌ) "කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වන ණය සුරකුම් පත්වල"

1A - PG 5488 — 470 (2021/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (11) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(11) "උපලේඛනයෙහි මෙම කොටසේ 'අ' ශීර්ෂය යටතේ, 7 සහ 8 ඡේදවල දක්වා ඇති බැහැර කිරීම් සහ සීමාකිරීම්වලට යටත්ව, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් විසින් නිකුත් කරනු ලබන, ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වන සියලුම වර්ගවල කොටස් (කොටස් සඳහා හිමිකම යටතේ වන කොටස් හෝ කොටස් බවට පරිවර්තනය කිරීම් ඇතුළුව) අත්පත් කර ගැනීම. දැරීම හෝ අත්හැර දැමීම."

(4) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 4 වන ඡේදයෙහි (9) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(9) "කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ, උපලේඛනයෙහි 1 වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ, (8) වන අනුඡේදයෙහි (උ) අයිතමය සහ (11) වන අනුඡේදය යටතේ, ශ්‍රී ලංකාවේ සමාගම් විසින් නිකුත් කරන ලද නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් වන ඉහත සඳහන් ලැයිස්තුගත කොටස් හෝ ලැයිස්තුගත ණය සුරැකුම්පත්, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයින් ආමුඛ ආයෝජන ගිණුම් හරහා ආයෝජන සිදුකරන අවස්ථාවක දී හැර, ශ්‍රී ලංකාවේ නේවාසික කිසිදු පුද්ගලයෙකුට විකිණීමට අවසර නොලැබේ."

(5) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 4 වන ඡේදයෙහි (10) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(10) "ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ලැයිස්තුගත කොටස් හෝ ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල සිදු කරනු ලබන ආයෝජන සඳහා තවදුරටත් අදාළ වන කොන්දේසි.

(අ) සමාගම කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත වීමට පෙර ආසන්නතම පූර්ව වර්ෂ තුන සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එ.ජ.ඩොලර් මිලියන 5ක අවමයකට අවම වශයෙන් සමාන වන පරිදි, සමාගමෙහි මුළු වාර්ෂික ආදායමෙන් 50% ක අවම මට්ටමක විදේශ විනිමය ඉපැයීම් අඛණ්ඩව පවත්වාගත් විදේශ විනිමය උපයන්නෙකු විය යුතු ය (එනම්, ආයෝජිතයා). මෙම නියෝග යටතේ එලෙස සුදුසුකම් ලබන ආයෝජිතයාට, එම මට්ටමෙහිම ඉදිරි විදේශ විනිමය ඉපැයීම් ද තිබිය යුතු ය.

(ආ) නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන ලද ලැයිස්තුගත කොටස්වල ආයෝජනයට අනේවාසික ආයෝජකයාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ලැබෙන අදාළ මුදල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට යටත්ව ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භකර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කරනු ලැබිය යුතු ය.

(ඇ) ඉහත 10 වන අනුඡේදයෙහි (ආ) අයිතමය යටතේ සඳහන් කර ඇති මුදල්වලින් 60%කට සමාන ප්‍රමාණයක්, ආයෝජිතයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන ඕනෑම ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා භාවිත කළ හැකි ය.

(ඈ) මෙම නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා සිදුකරන ලද එකී ආයෝජනවල යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භකර පවත්වාගෙන යනු ලබන එම ආයෝජන සිදුකරනු ලැබූ විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත, එම ගෙවීම් ලැබුණු දින සිට මාසයක් ඇතුළත, ශ්‍රී ලංකාව වෙත ආපසු රැගෙන එනු ලැබිය යුතු ය.

(ඉ) එලෙස ලැබෙන ලැබීම්වල ප්‍රාග්ධන ලාභයෙන් 50%ක කොටසකට සමාන ප්‍රමාණයක් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරනු ලබන ඕනෑම ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා යොදාගත හැකි ය. එවැනි අඛණ්ඩ ආයෝජනවල යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ද ඉහත 10 වන අනුඡේදයේ (ඇ) අයිතමය යටතේ වන කොන්දේසියට යටත් විය යුතු ය.

(ඊ) ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල ආයෝජනයට අනේවාසික ආයෝජකයාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ලැබෙන අදාළ මුදල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන යටතේ ආයෝජිතයා විසින් ආරම්භකර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(උ) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත් හෝ ලැයිස්තුගත කොටස් මත ලැබෙන යම් ආදායමක් හෝ කල්පිරීමෙන් ලද මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන යටතේ ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භකර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ පවත්නා ආයෝජිතයාගේ විදේශ විනිමය ඉපැයීම්වලින් පමණක් ගෙවනු ලැබිය යුතු ය.

(ඌ) මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද කොළඹ කොටස් හුවමාරුවෙහි නීතිරීති ආයෝජකයා විසින් පිළිපැදිය යුතු ය.”

07 - 353

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.